ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2023/2024

LLU 5810 - ඉඩම් නීතිය

කාලය - පැය 1

දිනය -: 2024 නොවැම්බර් 05 | වේලාව -: ප.ව. 03.30 – ප.ව 04.30

---

<u>එක් ප්‍රශ්නයකට පමණක්</u> පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. නිවාඩුවකට රටින් පිටත්වීමට ප්‍රථම නාථ සිය පැරණි පාසල් මිතුරෙකු වූ වාසු හට නුවරඑළියේ පිහිටි තම දේපළ බලා ගැනීමට පැමිණෙන ලෙස ආරාධනා කළේය. නාථ නැවත ශ්‍රී ලංකාවට පැමිණි පසු දේපළ භාරදීමට වාසු එකඟ විය.

   2023 වර්ෂයේ ජනවාරි මස නාථ විදෙස්ගත වූ අතර ඉන් පසු වාසු සහ ඔහුගේ පවුලේ පිරිස නාථට අයත් පැරණි මාදිලියේ නිවසේ පදිංචි විය. වාසුගේ බිරිඳ වූ රමණී මෙම නිවස ඉදිරිපිට රෝස මල් පාත්තියක් හා එළවලු වගා කළාය. වාසු විදුලි පංකාවක් සහ බිත්ති ලාම්පු කිහිපයක් නිවසේ උඩුමහලේ සවි කළේය. තවද එහා මෙහා කළ හැකි පොත් රාක්ක කිහිපයක් වාසු මිලදී ගත්තේ ඔවුන්ගේ දියණිය වූ අනගි සඳහා කියවීමේ කාමරයක් සෑදීමටයි. වාසුගේ පුත්‍රයා වූ සුවහස් උඩුමහලේ වූ නාන කාමරය තුළ වතුර උණු කරන යන්ත්‍රයක් සවිකළේය.

   2024 ජනවාරි මස නාථ ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔහු වාසුට දැනුම් දුන්නේ තමා නුවරඑළියේ පිහිටි නිවසේ රැඳී සිටීමට අදහස් කරන බවයි. නාථගේ ඉල්ලීම අනුව වාසු එම දේපලින් ඉවත් වීමට සූදානම් විය. වාසු නිවස සහ දේපල හැර යාමේදී ඔවුන් විසින් නිවසට සහ දේපලට සිදුකරන ලද අමතර එකතු කිරීම් සහ අලුත් වැඩියාවන් ඉවත් කිරීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත් වාසුගේ මෙම අදහසට විරුද්ධ වෙමින් නාථ පවසන ලද්දේ සිදුකර ඇති අමතර එකතු කිරීම් සහ අලුත් වැඩියාවන් දැන් නිවසේ සහ දේපලේ කොටසක් වී ඇති බවයි.

   වාසු ඔබගෙන් නීති උපදෙස් පතයි. අදාළ නඩු තීරණ භාවිතා කරමින් වාසුට උපදෙස් දෙන්න.

   (ලකුණු 20)

2. *exceptio rei venditae et traditae* මූලධර්මය සහ එය ශ්‍රී ලංකාව තුළ අදාල වන ආකාරය විග්‍රහ කරන්න. ඔබගේ පිළිතුර අදාළ නඩු තීරණ දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 20)

**** ප්‍රකාශන හිමිකම ඇවිරිණි****